# 07 ශ්‍රේණිය

# ඉතිහාසය

## පැරණි ගංගා නිම්න ශිෂ්ටාචාර - යුප්‍රටීස් - ටයිග්‍රීස් ශිෂ්ටාචාරය



අන්තර්ගතය හා සැකසුම -
රසික ප්‍රියදර්ශන - ව/ ඉ/ රිදී/ උදන්විට මහා විද්‍යාලය, මැල්සිරිපුර

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

# හැදින්වීම - යුප්‍රටීස් - ටයිග්‍රිස් ශිෂ්ටාචාරය

- යුප්‍රටීස්-ටයිග්‍රිස් නිම්න ප්‍රදේශය එකල **මෙසපොතේමියාව** ලෙස හැදින්වුණු අතර වර්තමානයේදී එය **ඉරාකය** යි.
- වසර 3000 කට පමණ පෙර අන්වර්ථ නම් -
    - ශිෂ්ටාචාරයේ තොටිල්ල
    - සශ්‍රීකභාවයේ චන්ද්‍රවංකය



# පිහිටීම හා ව්‍යාප්තිය - යුප්‍රටීස් - ටයිග්‍රීස් ශිෂ්ටාචාරය

## ගංගා දෙකක් මැද

යුප්‍රටීස් - ටයිග්‍රීස් නිම්න ශිෂ්ටාචාරය ව්‍යාප්ත ව තිබුණේ වර්තමාන ඉරාක දේශයට අයත් භූමි භාගයේය.

එනම් පර්සියානු බොක්කට ගලා බසින යුප්‍රටීස් - ටයිග්‍රීස් යන ගංගා අතර ප්‍රදේශයේ ය.





e තක්සලාව
The National e-learning Portal for the General Education

# පිහිටීම හා ව්‍යාප්තිය - යුප්‍රටීස් - ටයිග්‍රීස් ශිෂ්ටාචාරය




## ගංගා දෙකක් මැද

මෙම ප්‍රදේශය එකල හැඳින්වුණේ **මෙසපොතේමියාව** යන නමිනි.

එහි අර්ථය දෙගංමැදිය/ ගංගා 2ක් මැද ඇති ප්‍රදේශය



## නගර හා පාලන ක්‍රමය - යුප්‍රටීස් - ටයිග්‍රීස් ශිෂ්ටාචාරය

### යුප්‍රටීස් -ටයිග්‍රීස් ශිෂ්ටාචාරයේ නගර

- ඉරිඩු
- නිපූර්
- උරුක්
- ඌර්

නගර මහනගර බවට ද
මහනගර රාජ්‍යබවට ද
ක්‍රමයෙන් වර්ධනය විය.



## පාලන ක්‍රමය - යුප්‍රටීස් - ටයිග්‍රීස් ශිෂ්ටාචාරය

- නගර මුල් කරගෙන, කල්යාමේදී මෙහි **රාජාණ්ඩු පාලන ක්‍රමයක්** බිහි විය.
- රජු රටේ නායකයා විය. ඔහුට රට පාලන කිරීමට දෙවියන්ගෙන් බලය පැවරී ඇතැයි විශ්වාස කෙරිණි.

දෙයියෝ දුන්න ඔටුන්න



- සුමේරියාවේ කැටයමක හමුරාබි රජුට ෂමාෂ් නම් ඉරු දෙවියන්ගෙන් මුද්දක් ද යෂ්ටියක් ද ප්‍රදානය කෙරෙන ආකාරය නිරූපණය කෙරේ.

## පාලන ක්‍රමය - යුප්‍රටීස් - ටයිග්‍රීස් ශිෂ්ටාචාරය



**දෙයියො දුන්න ඔටුන්න**

- පාලනය කිරීමටත් යුක්තිය පසිඳලීමටත් දෙවියන් රජුට බලය පැවරීම මේ මගින් සංකේතවත් වූ බව සිතිය හැකිය.

# නගර හා පාලන ක්‍රමය - යුප්‍රටීස් - ටයිග්‍රීස් ශිෂ්ටාචාරය

## නඩත්තුව බදු වලින්

- පාලනය පවත්වාගෙන යාමට අවශ්‍ය අදායම සොයාගත්තේ බදු අය කිරීමෙනි.
- මෙසපොතේමියාවේ ක්‍රමවත් බදු අය කිරීමක් පැවතුනි.
- බදු අය කර ගැනීමට පදනම් වු සිතියම් පවා සකස් කොට තිබිණි.

# නගර හා පාලන ක්‍රමය - යුප්‍රටීස් - ටයිග්‍රීස් ශිෂ්ටාචාරය

**හමුරාබි ප්‍රඥප්තිය**



- ඉහත කී හමුරාබි රාජ වංශය යටතේ සංවිධානය වු රාජ්‍ය පරිපාලනයේ විධිමත් විය.
- එය රටේ සංවර්ධනය සඳහා කටයුතු කිරීමට උපකාරි විය.
- ආකේඩියන් රජුකු වු **හමුරාබි රජු** යුද්ධ වීරයෙක් ද රාජ්‍ය පාලකයෙක් ද නීති විශාරදයෙක් ද විය.
- ඔහු විවිධ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ඇති කළ නීති සංග්‍රහය **හමුරාබි ප්‍රඥප්තිය** යනුවෙන් හැඳින්වේ.

## ආර්ථික තොරතුරු - යුප්‍රටීස්-ටයිග්‍රීස් ශිෂ්ටාචාරය

- මෙහි ආර්ථික ක්‍රමයේ පදනම
  - ✓ කෘෂිකර්මාන්තය
  - ✓ සත්ව පාලනය

ගොවියන්, එඬේරුන් සමග වෙළෙන්දන්

- ලෝකයේ ප්‍රථමයෙන්ම මුදල් භාවිත කළ ශිෂ්ටාචාරයයි.
- රටේ ආර්ථික තත්ත්වය රදා පැවතුණ ප්‍රධාන සාධක
  - ✓ අභ්‍යන්තර වෙළෙදාම
  - ✓ ශිෂ්ටාචාර අතර වෙළෙදාම
- මේවා භාණ්ඩ හුවමාරු ක්‍රමයට වඩා දියුණු ගනුදෙනු ක්‍රමයක් මෙසපොතේමියාවේ පැවති බවට මුදල් හා භාවිතය සාධකයකි.



# ආගමික ඇදහිලි හා විශ්වාස - යුප්‍රටීස්-ටයිග්‍රීස් ශිෂ්ටාචාරය

## දෙයියන්ගේ රට

- එකල පැවති ප්‍රධානතම ඇදහිලි ක්‍රමය - දෙවියන් පිළිබඳ විශ්වාසය සහ ඔවුනට පුද පූජා පැවැත්වීම

- එකල ජනප්‍රිය දෙවිවරු
  - -- මාඩුක් -- ඉආ
  - -- සින් -- ෂමාෂ්

- සඳ දෙවියන් සහ හිරු දෙවියන් දිගු රැවුලක් ඇති බුද්ධිමත් අයගේ ස්වරූපයෙන් කැටයම් කර ඇත.

- හිරුට අහසට පොළොවට ස්වර්ගයට මුහුදට හා සුළඟට අධිපති දෙවිවරු වූහ. **එස්තර්** නමින් දේවතාවියක් වන්දනාමානයට පාත්‍ර වී ඇත.



මාඩුක් දෙවියා

# ආගමික ඇදහිලි හා විශ්වාස - යුප්‍රටීස්-ටයිග්‍රීස් ශිෂ්ටාචාරය



- සෑම පුද්ගලයෙකු සඳහා ම **පෞද්ගලික දෙවියෙකු** ද විය.
- මිනිසාගේ ගැලවීම ඇත්තේ මේ දෙවියන් මත බව විශ්වාස කෙරිණි.



- දෙවියන් හා මිනිසුන් අතර සම්බන්ධතා පවත්වන පූජකයෝ ද වූහ.
- **ශිගුරාත්** වැනි විශාල ආගමික ගොඩනැගිලි ද විය.

# ලේඛන කලාව - යුප්‍රටීස්-ටයිග්‍රීස් ශිෂ්ටාචාරය

- වෙනත් බොහෝ කලාවන් මෙන්ම ලේඛන කලාව ද ආරම්භ වන්නට ඇත්තේ මෙසපොතේමියාවේ යැයි විශ්වාස කරනු ලැබේ.

- ආරම්භයේ දී ලිවීම කර ඇත්තේ තෙත මැටි පුවරුවල යි.
- එහි ලියූ අකුරු **කූනාය(කූඤ්ඤ) අක්ෂර** නමින් හඳුන්වනු ලබයි. කෝටු කැබැල්ලක් උල් කරගෙන මැටි පුවරුවල ලියා ඇති නිසා එම අක්ෂර ඒ නමින් හඳුන්වයි.
- රූපයක් හැඳින්වීමට රූපයක් ඇඳීමෙන් ආරම්භ වූ එම ක්‍රමය පූර්ණ සංකේත අක්ෂර පද්ධතියක් දක්වා වර්ධනය විය.

- ශතවර්ෂ කිහිපයකට පසු ලිවීම සඳහා පැපිරස් පත්‍ර භාවිත කිරීම නිසා මැටි පලකවල ලිවීම අභාවයට ගියේ ය.

මැටි පුවරු හා කූඤ්ඤ



# ලේඛන කලාව - යුප්‍රටීස්-ටයිග්‍රීස් ශ්ෂ්ටාචාරය

- නිපුර් නගරයේ දේවාලයක මැටි පුවරු ලේඛන විශාල රැස්කර තිබිණි.
- මෙය ලෝකයේ පැරණිතම පුස්තකාලයක් ලෙස සැලකිය හැක.



පැරණි ම පොත් ගුල



# විද්‍යාව හා තාක්ෂණය - යුප්‍රටීස්-ටයිග්‍රීස් ශිෂ්ටාචාරය

## කැලැන්ඩරය හා ඔරලෝසුව




- අද අප භාවිතා කරන
  තත්පර 60
  මිනිත්තු 1යි
  මිනිත්තු 60 පැය 1යි
  යන ගණිත මූලධර්ම ක්‍රමය හඳුන්වාදෙන ලද්දේ ද මෙසපොතේමියානුවන් විසිනි.
- ලක්ෂයයක් වටා ඇති කෝණවල අගය අංශක 360 යන්නද එකල භාවිත කරන ලද්දකි.

- දින දර්ශනය ද මෙසපොතේමියාවෙ නිර්මාණය වූවකි.
- එය ගොවිතැන සඳහා කාලය දැන ගැනීමට භාවිතා කරන ලදි.

## විද්‍යාව හා තාක්ෂණය

- ලෝකයේ ප්‍රථම සිතියම ද සකසන ලද්දේ **මෙසපොතේමියාවෙහි** ය.
- මැටි පුවරුවල ඇති මේ සිතියම් බදු අය කිරීම් සදහා ප්‍රයෝජනයට ගන්නට ඇතැයි සැලකේ.
- **රෝදය** සොයා ගැනුනේ ද මෙසපොතේමියාවෙහි ය.
- යුද්ධ කටයුතු සදහා රථ තැනීමට ද බර ඇදීම සදහා කරත්ත තැනීමට ද මේ රෝදය යොදා ගෙන ඇති බව පෙනේ.
- රෝද දෙකක් යෙදු රත නිපදවීම ද මේ යුගයේ දී ම මෙසපොතේමියාවේ සිදු විය.
- ගොඩනැගිලි ඉංජිනේරුවකු විසින් ගලක ඇද ඇති දේවාලයක සැලැස්ම ලොව ප්‍රථම ගොඩනැගිලි සැලැස්ම විය හැකිය.

කැරකෙන රෝදේ



## සංස්කෘතිය

### උයන එල්ලීම

- පැරණි ලෝකයේ තිබූ හතෙන් එක් පුදුමයක් වන එල්ලෙන උද්‍යානය පිහිටියේ මෙසපොතේමියානු ශිෂ්ටාචාරයට අයත් බැබිලෝනියාවේ ය.
- මෙය තට්ටු හතක් ඇති මාලිගා රාශියකින් යුතු ගෘහ නිර්මාණ සංකීර්ණයකි.
- මෙසපොතේමියාවේ ගෘහනිර්මාණ ගැන සාකච්ඡා කරන හැම විටම ශිගුරාත් ගොඩනැගිල්ල ගැන සාකච්ඡා කෙරේ.



# ප්‍රතිමා

- **ගෞඩියා ප්‍රතිමාව** නෙලා ඇත්තේ තද කලු ගලෙනි.
- එහෙත් එහි මුහුණේ ඉරියව් කෙතරම් ප්‍රාණවත් ස්වභාවයක් ගන්නවාදැයි එය දුටු විට පෙනේ.
- ඔහුගේ මුහුණේ ඇති තේජාන්විතභාවය එහිලා අපුරුලෙස නිරූපණය කර ඇත.



# කැටයම්

ඉතා විසිතුරු ලෙස කැටයම් කරන ලද ඵලක ඇත. ඒවායේ නිරූපිත ස්ත්‍රීන්ගේ සහ පුරුෂයන්ගේ දේහ ලක්ෂණ යථාරූපී ලෙස මූර්තිමත් කිරීමට එකල කලාකරුවා සමත් වී තිබේ.

